# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1998 අංක 38 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1998 ජුනි මස 22 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1998 ජුනි මස 26 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 3.50 යි. තැපැල් ගාස්තුව : රු. 2.50 යි.

# 1998 අංක 38 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1998 ජුනි මස 22 වන දින]

ඇල්. ඩී.—ඕ. 35/97.

**සිවිල් නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1998 අංක 38 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 524 වන වගන්තිය, මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 101 වන අධිකාරයේ 524 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම, මෙහි පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ආආ) පෙත්සම්කරුගේ උපරිම දැනීම අනුව මියගිය තැනැත්තාගේ උරුමක්කාරයන් ;"; සහ

(2) ඒ වගන්තියේ (5) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 757 වන වගන්තිය, මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 757 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට, මෙහි පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(2) අභියාචනය කිරීමට අවසර ලබා ගැනීම සඳහා වූ ඉල්ලීමක් අභියාචනාධිකරණ රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ගොනු කරනු ලැබූ විට රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ ඉල්ලුම්පත්‍රයට අංක යොදා, ඒ ඉල්ලීම පිළිබඳ දැන්වීමක්, පෙත්සමේ, දිවුරුම් පත්‍රයේ සහ ඇමුණුම් කිසිවක් ඇත්නම් ඒවායේ පිටපත් ද සමග එහි නම් කර තිබෙන එක් එක් වගඋත්තරකරු වෙත, අප්‍රමාදව ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය. ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයේ දී එම ඉල්ලීමට විරුද්ධව වගඋත්තරකරු ඉදිරිපත් කරන

2—D 048933—12,900 (98/04)

කරුණුවලට සවන් දෙනු ලබන බව ඒ දැන්වීමෙන් ප්‍රකාශ විය යුතු ය. අභියාචනය කිරීමට අවසර ලබා ගැනීම සඳහා වූ ඉල්ලීමකට අත්හිටුවීමේ ආඥාවක්, අතුරු ඉන්ජන්ෂන් තහනමක් හෝ වෙනත් සහනයක් සඳහා ආයාචනයක් ඇතුළත් විය හැකි ය.'' ;

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් ;

(3) ඒ උපවගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(4) අභියාචනය කිරීමට අවසර ලබා ගැනීම සඳහා වූ ඉල්ලීම (2) වන උපවගන්තිය යටතේ යවන දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයේ දී හෝ අධිකරණය විසින් නියම කරනු ලබන වෙනත් යම් දිනයක දී, අධිකරණය විසින් විභාග කොට, අභියාචනය කිරීමට අවසර දීම හෝ ප්‍රතික්ෂේප කිරීම කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද අභියාචනය කිරීමට අවසර ලබා ගැනීම සඳහා වූ ඉල්ලීම විභාග කොට සුදුස්සක් කරන තෙක් සහ අභියාචනය කිරීමට අවසර දෙනු ලැබුවහොත් අභියාචනය විභාග කොට සුදුස්සක් කරනු ලබනතෙක්, අවස්ථාගත කරුණු අනුව සුදුසු යයි අධිකරණය සලකන අතුරු සහන ප්‍රදානය කරන ආඥාවක් අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය.''.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.